# මාසික වෙළඳ විවරණිකාව

## ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
## ශ්‍රී ලංකා මහ බැංකුව

**2022 සැප්තැම්බර්**
**04 වෙළුම 09 නිකුතුව**

## විශේෂ සිදුවීම්







2022 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,079ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.3කින් ඉහළ ගියේය.

2022 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,284ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 15.8කින් පහළ ගියේය.







2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 11.7කින් ඉහළ ගිය අතර, ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 5.7කින් පහළ ගියේය.

2022 වසරේ සැප්තැම්බර් මාසය තුළ දී වෙළඳ ගිණුමේ ශේෂය, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති එ.ජ.ඩොලර් මිලියන 492ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 206ක හිඟයක් වාර්තා කළේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.- සැප්.)



# අපනයන ක්‍රියාකාරිත්වය

**අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.- සැප්.)**




**අපනයන පරිමා හා මිල දර්ශක (ජන.- සැප්.)**




2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහළ යෑමක් වාර්තා කළේය.

2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 6.7කින් සහ සියයට 4.7කින් ඉහළ ගියේය.

# කෘෂිකාර්මික අපනයන

**කෘෂිකාර්මික අපනයන ආදායම**




**කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක**




**කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-සැප්.)**




**තේ සහ රබර් මිල ගණන් ***




*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත

2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, තේ, කුළුබඩු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම පහළ යෑමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, මුහුදු ආහාර, පොල් සහ රබර් ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන

## කාර්මික අපනයන ආදායම




## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-සැප්.)




## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත, සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී රබර් නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.- සැප්.)




## ආනයන පරිමා හා මිල දර්ශකය (ජන.- සැප්.)




අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියද, මූලික වශයෙන්, ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 19.1කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 16.6කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන













ප්‍රධාන වශයෙන්, විදුලි සංදේශ උපකරණ, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ ගෘහ උපකරණ ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන මාස නවය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතේ වර්ග කරන තෙල් හා මේද වර්ග, කිරි නිෂ්පාදිත සහ එළවළු ආනයන වියදමෙහි පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, පාන වර්ග සහ රෙදිපිළි හා උපාංග සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

# අන්තර් භාණ්ඩ ආනයන






### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- සැප්.)




### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)




*2021 වසරේ මාර්තු, ජූනි, සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි සහ ජූලි මාසවල බොරතෙල් ආනයනය කර නැත.

ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ මූල ලෝහ, තිරිඟු, රථ වාහන හා යන්ත්‍රෝපකරණ කොටස් සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන

### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- සැප්.)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ප්‍රවාහන උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩ තුනෙහිම ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2022 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසාන වන මාස නවය තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | සැප්.- 2021 | සැප්.- 2022 | වෙනස (%) | ජන. - සැප්. 2021 | ජන.- සැප්. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **221.2** | **231.2** | **4.5** | **1,986.7** | **1,939.8** | **-2.4** |
| එයින් | තේ | 104.1 | 117.8 | 13.2 | 986.6 | 937.1 | -5.0 |
| | පොල් | 35.8 | 29.7 | -17.1 | 312.7 | 314.0 | 0.4 |
| | කුළුබඩු | 37.3 | 40.6 | 8.8 | 319.6 | 274.1 | -14.3 |
| | මුහුදු ආහාර | 22.6 | 17.0 | -24.9 | 188.1 | 205.3 | 9.2 |
| **කාර්මික අපනයන** | | **808.8** | **842.8** | **4.2** | **6,903.1** | **8,000.6** | **15.9** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 458.5 | 481.5 | 5.0 | 3,893.3 | 4,577.2 | 17.6 |
| | රබර් නිෂ්පාදිත | 90.9 | 78.9 | -13.2 | 772.6 | 755.1 | -2.3 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 53.7 | 30.0 | -44.1 | 348.6 | 439.9 | 26.2 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 43.7 | 39.8 | -8.9 | 397.7 | 405.8 | 2.0 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 37.4 | 52.0 | 38.9 | 366.5 | 427.9 | 16.7 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 20.5 | 46.9 | 129.1 | 199.5 | 325.7 | 63.2 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.5 | 9.4 | 70.1 | 39.3 | 63.6 | 61.7 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **4.4** | **4.9** | **9.7** | **48.7** | **40.7** | **-16.4** |
| **මුළු අපනයන** | | **1,034.5** | **1,078.9** | **4.3** | **8,938.5** | **9,981.1** | **11.7** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | සැප්.- 2021 | සැප්.- 2022 | වෙනස (%) | ජන. - සැප්. 2021 | ජන.- සැප්. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **310.7** | **201.1** | **-35.3** | **2,890.0** | **2,146.7** | **-25.7** |
| ආහාර හා පාන වර්ග | | 109.8 | 121.5 | 10.7 | 1,261.7 | 1,227.7 | -2.7 |
| එයින් | එළවළු (ආ) | 23.9 | 23.5 | -1.7 | 302.6 | 249.7 | -17.5 |
| | සහල් | 0.7 | 24.9 | 3,257.4 | 9.2 | 254.5 | 2,669.6 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 201.0 | 79.6 | -60.4 | 1,628.3 | 919.0 | -43.6 |
| එයින් | පෞද්ගලික රථවාහන | 2.1 | 0.7 | -64.4 | 9.9 | 6.5 | -34.5 |
| **අන්තර් භාණ්ඩ** | | **848.4** | **913.4** | **7.7** | **8,790.8** | **9,497.4** | **8.0** |
| එයින් | ඉන්ධන | 201.0 | 376.4 | 87.3 | 2,596.8 | 3,694.3 | 42.3 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 262.2 | 231.5 | -11.7 | 2,205.9 | 2,407.2 | 9.1 |
| | පොහොර | 0.4 | 6.3 | 1,373.4 | 104.4 | 104.5 | 0.1 |
| | තිරිඟු හා ඉරිඟු | 25.5 | 18.2 | -28.5 | 291.4 | 188.5 | -35.3 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **366.9** | **169.9** | **-53.7** | **3,256.7** | **2,441.1** | **-25.0** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 226.8 | 108.3 | -52.3 | 2,049.4 | 1,570.7 | -23.4 |
| **මුළු ආනයන** | | **1,526.0** | **1,284.4** | **-15.8** | **14,937.5** | **14,085.2** | **-5.7** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | සැප්.- 2021 | සැප්.- 2022 | වෙනස (%) | ජන. - සැප්. 2021 | ජන.- සැප්. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -491.6 | -205.5 | | -5,999.0 | -4,104.2 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | සැප්.- 2021 | සැප්.- 2022 | වෙනස (%) | ජන. - සැප්. 2021 | ජන.- සැප්. 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | |
| වටිනාකම් දර්ශකය | 144.0 | 150.2 | 4.3 | 138.2 | 154.3 | 11.7 |
| පරිමා දර්ශකය | 157.5 | 147.0 | -6.7 | 153.9 | 164.2 | 6.7 |
| මිල දර්ශකය | 91.4 | 102.2 | 11.8 | 89.8 | 94.0 | 4.7 |
| **ආනයන** | | | | | | |
| වටිනාකම් දර්ශකය | 136.6 | 114.9 | -15.8 | 148.5 | 140.1 | -5.7 |
| පරිමා දර්ශකය | 138.0 | 102.7 | -25.6 | 158.7 | 128.3 | -19.1 |
| මිල දර්ශකය | 99.0 | 111.9 | 13.1 | 93.6 | 109.2 | 16.6 |
| **වෙළඳ මිල අනුපාතය** | 92.3 | 91.3 | -1.1 | 96.0 | 86.1 | -10.2 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද